**මාතර විශ්වවිද්‍යාල විද්‍යායතනය - 2022**

**----------------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

මාතර විශ්වවිද්‍යාල විද්‍යායතනයේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, අරමුදල් සහ සංචිත වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මාතර විශ්වවිද්‍යාල විද්‍යායතනයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදුකරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රීලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.
මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, විශ්වවිද්‍යාල විද්‍යායතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය විශ්වවිද්‍යාල විද්‍යායතනය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා විශ්වවිද්‍යාල විද්‍යායතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

විශ්වවිද්‍යාල විද්‍යායතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශවය විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, විශ්වවිද්‍යාල විද්‍යායතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තව දුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් විශ්වවිද්‍යාල විද්‍යායතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා විශ්වවිද්‍යාල විද්‍යායතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළයුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂයය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ විශ්වවිද්‍යාල විද්‍යායතනයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකි වන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත් පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම්කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේද යන බව.

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ විශ්වවිද්‍යාල විද්‍යායතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව විශ්වවිද්‍යාල විද්‍යායතනය ක්‍රියාකර ඇති බව.

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව.

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

ගණුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරිබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගණුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම්කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් "මනාලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

### 1.5.2 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය තුළදී මිලදී ගෙන තිබූ රු.1,353,320 ක් වටිනා ඉගෙනුම් කළමනාකරණ පද්ධතිය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 20 අනුව අස්පෘශ්‍ය වත්කමක් ලෙස හඳුනා ගෙන ගිණුම් ගත කළ යුතු වුවද දේපල පිරියත හා උපකරණ යටතේ ගිණුම්ගත කර තිබුණි. | ඉදිරි වර්ෂයේ සිට මෙය අස්පෘශ්‍ය වත්කමක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

### 1.5.3 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2015 වර්ෂයේ සිට විශ්වවිද්‍යාල විද්‍යායතනය පවත්වා ගෙන යනු ලබන හෙක්ටයාර 0.5854 ක ඉඩම තක්සේරු | මෙම ඉඩම මාතර ප්‍රාදේශීය ලේකම් විසින් නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය වෙත භාර දී ඇති බැවින් | විද්‍යායතනය පවත්වා ගෙන යනු ලබන |

| | | | |
|---|---|---|---|
| | කර මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම කටයුතු කර නොතිබුණි. | විද්‍යායතනය පවත්වාගෙන යාමේ හා සංවර්ධන කටයුතු කිරීමේ කිසිදු බාධාවක් නොමැති බව. | ඉඩම තක්සේරු කර මූල්‍ය ප්‍රකාශන වල දැක්විය යුතුය. |
| (ආ) | ඉකුත් වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.191,000 ක් වූ විගණන ගාස්තු ඌන වෙන් කිරීම සමුච්චිත අරමුදලට ගැලපීම් නොකිරීමෙන් සමාලෝචිත වර්ෂය සඳහා ඉදිරියට ගෙන එන ලද ගෙවිය යුතු විගණන ගාස්තු එම ප්‍රමාණයෙන් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | අදාල වර්ෂයේ සත්‍ය විගණන ගාස්තුව පිලිබඳව පවතින අවිනිශ්චිතතාවය මත අදාල වියදම වෙන් කිරීමක් ලෙස ගිණුම් ගත කරනු ලබන බැවින් ඉදිරි වර්ෂයේදී ඌන හෝ අධි වෙන් කිරීම් ගලපනු ලැබේ. | ඉකුත් වර්ෂයට අදාලව සිදු කරන ලද ප්‍රතිලාදනයන්හී ඌන හෝ අධි වෙන්කිරීම් ගැලපීමේදී පෙර වර්ෂයේ ලාභයට ගැලපීමට කටයුතු කළ යුතුය. |

## 1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| ------------------------- | ------------------ | --------------------------- | ------------ |
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 396(ඇ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට නිකුත්කළ නමුත් ගෙවීම සඳහා ඉදිරිපත් නොකළ වටිනාකම රු.44,545 ක් වූ චෙක්පත් 08 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | අදාල චෙක්පත් අවලංගු කර විද්‍යායතනයේ අදායමට ගැනීමට 31.03.2023 දින පැවති පාලක මණ්ඩලය අනුමත කරන ලද අතර එම චෙක්පත් සම්බන්ධයෙන් අනෙකුත් කටයුතු මුදල් රෙගුලාසි අනුව කටයුතු කරන බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.27,189,925 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.27,561,656 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.371,731 ක වර්ධනයක් නිරීක්ෂණය විය.

[

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 නිශ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපළ, පිරියත හා උපකරණ

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | --------------------- | -------------------------------- | ----------- |
| (අ) | 2015 වර්ෂයේදී තරුණ කටයුතු හා | එම සියලු උපකරණ ප්‍රායෝගික නිසි | ශක්‍යතා |

| | | | |
|---|---|---|---|
| | මානව සම්පත් සංවර්ධන අමාත්‍යාංශය විසින් විලේපනවේදය රසායනාගාරය සඳහා ලබා දී තිබූ උපකරණ වලින් රු.312,728 ක් වටිනා උපකරණ සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් අදාල අරමුණු වෙනුවෙන් උපයෝජනය නොකර නිශ්කාර්යව පැවතුණි. | පුහුණුව සඳහා භාවිතා කරනු ලැබේ. එම උපකරණ ප්‍රායෝගික පුහුණුව සඳහා භාවිතා කිරීමෙන් පසු පිරිසිදුකොට ජීවානුහරණය කොට නැවත අසුරුමතුල බහා කබඩ් තුල අසුරන අතර නැවත එම උපකරණ අදාල මොඩියුලයේ ප්‍රායෝගික පුහුණුව සඳහා අවශ්‍යවන අවස්ථාවේදී නැවත භාවිතයට ගනු ලැබේ. | අධ්‍යනයක් සිදු කර මිලදී ගත යුතු අතර මිලදී ගන්නා ලද උපකරණ අදාල කාර්යය සඳහා උපයෝජනය කළ යුතුය. |
| (ආ) | සිසුන්ගේ ප්‍රායෝගික ක්‍රියාකාරකම් සඳහා 2014 වර්ෂයේදී රු.1,250,000 ක් වැය කර මිලදී ගෙන තිබුණු ස්වයං චලන පාඨමාලාවට අදාල උපකරණයක් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් ප්‍රයෝජනයට නොගෙන නිශ්කාර්යව පැවතුණි. | ස්වයං චලන පාඨමාලාව සතුව ඇති මෝටර් රථ එසවුම සමග ඇති, රෝද එක එල්ල සකසන උපකරණය ස්ථාපනය කිරීමේ ඉඩකඩ පිළිබඳ ප්‍රයෝගික ගැටළු පවති. මෙම උපකරණය ස්ථාපනය කිරීම සඳහා ආසන්න වශයෙන් දිග අඩි 38, උස අඩි 20 හා පළල අඩි 15 පමණ ඉඩකඩ සහිත ගොඩනැගිල්ලක් අවශ්‍යවේ. අදාල උපකරණය සවිකිරීම සඳහා ප්‍රමාණවත් බිම් කොටසක් මෙම ආයතනයේ නොමැත. විකල්ප ඉඩමක් ලබා දෙන ලෙස වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලය සහ අමාත්‍යාංශය වෙත ඉල්ලීම් කර ඇති නමුත් තවමත් ඉඩමක් ලැබී නොමැත. අප ආයතනයට විකල්ප ඉඩමක් ලැබුණු පසුව අදාල උපකරණ නිසි ප්‍රමිතියට අනුව සවිකිරීමට කටයුතු කරන බව. | නිසි ශක්‍යතා අධ්‍යයනයක් සිදු නොකර මෙම උපකරණ මිලදී ගැනීමට සම්බන්ධ නිලධාරීන් හඳුනාගෙන ඔවුන් සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |